# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. *Website : www.defence.lk*

මගේ අංකය / எனது இல / My No: MOD/DEF/GS/SALW/5/SLA (V) (114)

ඔබේ අංකය / உமது இல / Your No:

තැ. පෙ. / த. பெட்டி / P.O. Box: 572

දුරකථන / தொலைபேசி / Telephone: 2430860-9, 2430870-8

ලේකම් / செயலாளர் / Secretary: දුර./தொ./Tel. : 011 2381154; ෆැක්ස්./பெ./Fax.: 011 2541529; වි. තැපෑල./மி.அ./Email : secdefence@defence.lk


දිනය / திகதி / Date: 2024.04.02

යුද්ධ හමුදාධිපති
යුද්ධ හමුදා මූලස්ථානය

නාවික හමුදාධිපති
නාවික හමුදා මූලස්ථානය

ගුවන් හමුදාධිපති
ගුවන් හමුදා මූලස්ථානය

**<u>ත්‍රිවිධ හමුදාවේ නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකර සිටින හමුදා පුද්ගලයන් හට සේවයෙන් ඉවත්වීම සඳහා පොදු සමා කාලයක් ප්‍රකාශයට පත් කිරීම.</u>**

නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකරව සිටින ත්‍රිවිධ හමුදා පුද්ගලයන් වෙත නිත්‍යානුකූලව සේවයෙන් ඉවත්වීම සඳහා 2024.04.20 දින සිට 2024.05.20 දින දක්වා පොදු සමාකාලයක් ප්‍රකාශයට පත්කිරීම සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ.

i. මෙම පොදු සමා කාලය තුළ රපෝර්තු කරන අයවළුන් නීත්‍යානුකූලව සේවයෙන් ඉවත්කිරීමට කටයුතු කළ යුතු අතර, යම් අයකුගෙන් අයවිය යුතු මුදලක් වෙත්නම් නීත්‍යානුකූලව ඉවත් කිරීමට පෙර එම මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය.

ii. මෙම සමා කාලය 2024.04.02 දිනට පෙර සිට නිවාඩු නොමැතිව නොපැමිණ සිටින අයවළුන් සඳහා පමණක් අදාළ කර ගත යුතුය.

iii. නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකර සිටින දැනට විදේශගතව සිටින ත්‍රිවිධ හමුදා සාමාජිකයන් වෙතද නැවත ඒකකය වෙත රපෝර්තු කිරීමකින් තොරව මෙම පොදු සමාකාලය තුළදී පහත කොන්දේසීන්ට යටත්ව නිත්‍යානුකූලව සේවයෙන් ඉවත් වීම සඳහා අනුමැතිය ලබාදෙනු ලැබේ.

අ. නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකිරීම හැර වෙනත් කිසිදු විනය විරෝධී ක්‍රියාවක් සම්බන්ධ නොනිමි විනය කටයුතු නොපැවතිය යුතුය.

ආ. නීති විරෝධී ක්‍රම මගින් විදේශගත වූ හෝ විදේශ ගත වීමේදී වංචනික ලෙස විදේශ ගමන් බලපත්‍ර සහ අනෙකුත් ලේඛන සකස් කර විදේශ ගත වී නොමැති බව ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙතින් තහවුරු කර ගත යුතුය.


අතිරේක ලේකම් (පරිපාලන) / மேலதிக செயலாளர் (நிர்வாகம்) / Additional Secretary (Administration) — දුර./தொ./Tel. - 011 2326000; ෆැක්ස්./பெ./Fax. - 011 2446300
අතිරේක ලේකම් (ආරක්ෂක) / மேலதிக செயலாளர் (பாதுகாப்பு) / Additional Secretary (Defence) — දුර./தொ./Tel. - 011 2389186; ෆැක්ස්./பெ./Fax. - 011 2441481
ප්‍රධාන මූල්‍ය නිලධාරී - I / தலைமை நிதி அதிகாரி - I / Chief Financial Officer - I — දුර./தொ./Tel. - 011 2439381; ෆැක්ස්./பெ./Fax. - 011 2390720
අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන) / மேலதிக செயலாளர் (சிவில் பாதுகாப்பும் அபிவிருத்தியும்) / Additional Secretary (Civil Defence and Development) — දුර./தொ./Tel. - 011 2335792; ෆැක්ස්./பெ./Fax. - 011 2335797
අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) / மேலதிக செயலாளர்(பாராளுமன்றம் மற். கொள்கையும்) / Additional Secretary (Parliament Affairs and Policy) — දුර./தொ./Tel. - 011 2389023; ෆැක්ස්./பெ./Fax. - 011 2389022
ප්‍රධාන මූල්‍ය නිලධාරී - II / தலைமை நிதி அதிகாரி - II / Chief Financial Officer - II — දුර./தொ./Tel. - 011 2421484; ෆැක්ස්./பெ./Fax. - 011 2421484
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) / பணிப்பாளர் நாயகம் (திட்டமிடல்) / Director General (Planning) — දුර./தொ./Tel. -011 2333963; ෆැක්ස්./பெ./Fax.-011 2336559
අතිරේක ලේකම් (තාක්ෂණ) / மேலதிக செயலாளர் (தொழிநுட்பம்) / Additional Secretary (Technical) — දුර./தொ./Tel. -011 2333930; ෆැක්ස්./பெ./Fax.-011 2421479

ඇ. ශ්‍රී ලංකා රජයේ අරමුදල් භාවිතා කරමින් හෝ විදේශ ප්‍රදායක ආයතන වෙතින් ත්‍රිවිධ හමුදාව වෙත ලබාදෙන ලද අවස්ථාවන් මගින් විදේශ අධ්‍යයන කටයුත්තකට,රාජ්‍යතාන්ත්‍රික කටයුත්තක් හෝ වෙනත් කිසියම් කාර්යයක් සඳහා විදේශ ගත වී නැවත මෙරටට වාර්තා නොකරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම පොදු සමාකාලය අදාළ කර නොගත යුතුය.

02. තවද, මෙම පොදු සමාකාලය ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, එම කරුණු නොපමාව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආ-III) වෙත යොමුකරන ලෙස කාරුණිකව දන්වමි.

හර්ෂ විතානආරච්චි
අතිරේක ලේකම් (ආරක්ෂක) වැ.බ.
ලේකම් වෙනුවට

පිටපත : හමුදා සම්බන්ධීකරණ නිලධාරී